මාවතගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 10 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

---------------------------

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්ව සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රියදුරු විවේකාගාරයේ ඉදිකිරීම් වටිනාකම රු.347,454 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධනවියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී මෙම වත්කම ඇතුළත් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | භෞතිකව නොපවතින රු.74,270 ක් වටිනා වත්කම් 5ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | භෞතිකව නොමැති වත්කම් ගිණුම්වලින් ඉවත් කළ යුතු වේ. | මෙම පාපැදිවලින් එකක් දැනටමත් භාවිතයේ පවතී. එකක් අබලන් වී ඇත. එය 2019 වෙන්දේසියට ඉදිරිපත් කල නමුත් වෙන්දේසි වී නොමැත. ඉතිරි දෙක සභාවට සම්බන්ධව පැවති ජල ව්‍යාපෘතියට ලැබුණු ඒවා අතර, ජල ව්‍යාපෘතිය සභාවෙන් වෙන් වී යාමේදී එය රැගෙන ගොස් ඇති බැවින්, ඊළඟ වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | කරමි. අත්කරත්ත භාවිතයේ පවතී. |
| (ඈ) | වාහන ලේඛනයේ පවතින බයිසිකලයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | මෙම වර්ෂයේදී තක්සේරු නිලධාරී මහතෙකු මගින් දැනටමත් නව මුදලක් තක්සේරු කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට තොග ශේෂය, උපලේඛන හාමූල්‍යා ප්‍රකාශනඅතර රු. 3,579,514 ක වෙනසක් පැවතුණි. | අදාළ වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විවිධ තැන්පත් උපලේඛන හා මූල්‍යා ප්‍රකාශන අතර රු. 59,281 ක වෙනසක් පැවතුණි. | අදාළ වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිණුමේ විවිධ තැන්පත් තුළ තැන්පත්වලට අමතරව මුද්දර බදු සහ සේවක ණය වැඩිපුර ලැබීම් ඇතුළත්ව ඇත. එබැවින්,එහි එකතුව රු.7,824,133 ක් වී ඇත. තැන්පත් උපලේඛනයෙහි වීඊ රේඛා තැන්පත් වැරදීමකින් ඇතුළත්ව ඇත. ශේෂ පිරික්සුමෙහිද දක්වා ඇත. |
| (ඊ) | ඉඩම් ගොඩනැගිලි අයිතම 6 ට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය හාමූල්‍යාප්‍රකාශන අතර රු.7,987,218 ක වෙනසක් පැවතුණි. | අදාළ වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය හා මූල්‍යා ප්‍රකාශනඅතර මෙම වෙනස්කම් පවතී. ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| (උ) | අවශ්‍යා තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,065,152 ක් වූ ගිණුම් විෂයයන් 06ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍යා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | දීර්ඝ කාලයක සිට පැවතගෙන එනකර්මාන්ත අත්තිකාරම්පිළිබඳ ලේඛන නොමැත.<br><br>මෝටර් රථ හා කරත්තලේඛනය ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. කොන්ක්‍රීට් ව්‍යාපෘතියට අදාළවදීර්ඝ කාලයක සිට පැවති ආදායම් ප්‍රමාණය ගිණුමෙහි උපලේඛනවල ඇති අතර ඒ හැර වෙන කිසිත් තොරතුරු නැත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදී ජනරජයේආයතන සංග්‍රහය | | | |
| vii වැනි පරිච්ඡේදයේ 12.2.5 වගන්තිය | විධිමත් පත්වීමක් නොමැතිව, ලේකම් තනතුරේ වැඩ බලන නිලධාරියා විසින් 2016 ජුනි මස සිට 2019 දෙසැම්බර් දක්වාරු.226,156 කවැඩ බැලීමේ දීමනාවක් ලබාගෙන තිබුණි. | පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | MN 07 ආරම්භක වැටුපෙන් 1/6 ක් වැඩ බැලීමේ දීමනාව ලෙස ගෙවා ඇති බව කාරුණිකව සඳහන් කරමි. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදී ජනරජයේමුදල්රෙගුලාසි 1646 | 2019 ජනවාරි-ඔක්තෝබර් දක්වා වාහන 06 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ ධාවන සටහන් හැකි ඉක්මනින් විගණන කාර්යාලයට ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29දිනැති අංක 30/2016දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 10 ක ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරවකටයුතු කළ යුතු වේ. | යාන්ත්‍රික ඉංජිනේරු මහතා විසින් වාහන කීපයක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කල බවත්, අනෙකුත් වාහන සඳහා ඉන්ධන පරීක්ෂා කිරීම සඳහා ඉදිරියේදී පැමිණෙන බව දන්වා ඇත. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,862,027 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,308,129 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හාබදු | 5,470,668 | 4,848,899 | 3,417,680 | 4,948,308 | 4,960,668 | 9,609,883 | 4,769,763 | 4,840,120 |
| බදු කුලී | 20,244,740 | 8,073,220 | 8,234,905 | 1,739,160 | 10,109,160 | 10,180,395 | 10,180,394 | 2,132,618 |
| බලපත්‍ර ගාස්තු | 303,000 | 261,820 | 261,800 | 70,400 | 602,000 | 326,728 | 326,728 | 70,400 |
| වෙනත් | 127,415,180 | 122,865,305 | 73,413,517 | 66,852,352 | 115,775,004 | 174,990,230 | 177,990,230 | 71,176,901 |
| එකතුව | 153,433,588 | 136,049,244 | 85,327,902 | 73,610,220 | 131,446,832 | 195,107,236 | 193,267,115 | 78,220,039 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආරම්භක හිඟය වූරු.4,840,120 කින් වර්ෂය තුළ අයකර තිබුණේ රු.931,648 ක් හෙවත් සියයට 19 ක් වැනි පහළ ප්‍රතිශතයකි. | ප්‍රාදේශීය සභාරීති ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී හිඟ ආදායම් එකතු කිරීමේ වැඩසටහන පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට පැවත එන රාජ්‍ය ආයතනවල වරිපනම් බදු හිඟය රු. 93,883 ක් විය. | ප්‍රාදේශීය සභාරීති ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රාජ්‍ය ආයතන වල වරිපනම් හිඟ පියවා ගැනීමට මේ වන විට ආයතනවලට ලිපි මගින් දැනුම් දී එම හිඟයෙන් කොටසක් අය කරගෙන ඇත. |
| (ඇ) | වරිපනම් දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකළ යුතු වුව ද අවසාන වරට2012 වර්ෂයේ සිදුකළදේපළ තක්සේරුවපදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | නව තක්සේරුවක් යොදාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | 2012 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව ක්‍රියාත්මත කරන ලද්දේ 2017 වර්ෂයේදීය. නව තක්සේරුවක් ලබා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**2.2.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආරම්භයේ පැවති රු. 2,132,618 ක් වූ හිඟයෙන් වර්ෂය තුල අයකර තිබුණේරු.664,604 ක් පමණි. | ගිවිසුම් ප්‍රකාරව කුලී අයකළ යුතු වේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | මාවතගම පොදු වෙළඳපොල එළ ගවමස් කඩයමාසිකව රු.106,847 කට බදුගත්පුද්ගලයකු ගිවිසුම්ගත මුදලට වඩා අඩු මුදලක් ගෙවීම හේතුවෙන් 2019 පෙබරවාරි සිට ජුනි දක්වා කාලයටරු. 54,310 ක පාඩුවක් සිදුව තිබුණි. | ගිවිසුම්ගත කුලී මුදල අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මාසයක ගාස්තුව ලෙස රු. 106,847 ක ගිවිසුමකට එළඹුනද ඔහු විසින් ගාස්තුව වැඩි බව දන්වමින් එම ගාස්තුව අඩු කර දෙන ලෙස කල ඉල්ලීමක් මත නැවත තක්සේරු මුදල මාස 12 න් බෙදා එය රු. 97,943 ක් ලෙස ගාස්තු අයකරගෙන ඇත. |
| (ඇ) | මාවතගම පොදු වෙළඳපොල එළු,කුකුල් මස් කඩය මාසිකව රු. 53,609 කටබදුගත් පුද්ගලයා විවෘත කළ දිනවලදී පමණක් බදු මුදල් ගෙවීම හේතුවෙන් 2019 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලයට රු. 68,117 ක අදායමක් අහිමි වී තිබුණි. | විධිමත් ගිවිසුම් ප්‍රකාරවබදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වෙළඳසැල විවෘතව තැබූ දිනවලට පමණක් මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගෙන් ලබා ගත් වාර්තාව මත ප්‍රාදේශීය සභාව මගින්ද ලබා ගත් විශේෂ අනුමැතිය මත ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| (ඈ) | මාවතගම පොදු වෙළඳපොල කඩ කාමර 8 කට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට රු.154,153 ක මුදලක් හිඟව පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් අයකළ යුතු වේ. | කඩකුලී හිඟයෙන් කොටසක් මේ වන විටද අයකරගෙන ඇති අතර, ඉතිරිය අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාවට අයත් ගොඩනැගිලි කුලියට දීමේදී දීර්ඝ කාලයක් තිස්සේ අයකර ගැනීමට ඇති රු.1,028,478 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් අය කළ යුතු වේ. | හිඟ ගොඩනැගිලි කුලී කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ලිපි යොමු කර ඇති අතර, මේ වන තෙක් අවශ්‍ය අනුමැතිය ලැබී නොමැත. |

**2.2.4** **බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට හිඟව පැවති රු. 70,400 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික බලපත්‍ර ගාස්තු නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ලිපි යොමු කර ඇති අතර, මේ වන තෙක් අවශ්‍ය අනුමැතිය ලැබී නොමැත. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණ පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, සභාව විසින් පනවා තිබූ අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කළ යුතු අතර සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නැත. |

## (ආ) අයවැයගත කර්මාන්ත ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ අයවැය ගත ප්‍රතිපාදනය රු.850,000 ක් වූ කර්මාන්ත 08 ක් වර්ෂය තුල නිම කර නොතිබූ අතර අයවැය ගත නොකළ රු.31,874,043 ක් වටිනා කර්මාන්ත 37 ක් නිම කර තිබුණි. | අයවැය ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කළ යුතු වේ. | ප්‍රදේශයේ මහජනතාවගේ වැඩි ඉල්ලීම හා වර්ෂා කාලයේදී ගමනාගමනයට අපහසුවන අයුරින් මාර්ග අබලන් වීම හා බෝක්කු කැඩීයාම හේතුවෙන් මෙම කර්මාන්ත සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වා සිටිමි. |

## (ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | දෛනිකව එකතු වන නොදිරන කසල ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භූමියේ තැනින් තැනට අක්‍රමවත්ව බැහැර කර තිබුණි. | දෛනිකව රැස්වන කසල ක්‍රමවත්ව වෙන්කර නියමිත ස්ථානවල ස්ථානගත කිරීම් තුළින් අංගනය පිරිසිදුව තබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නොදිරන අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන යටතේ එකතු කල කසළ කොන්ක්‍රීට් පැඩයේ ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බැවින්, ගොඩනැගිල්ලෙන් පිටත ගොඩ ගසා තිබුණි. (විගණන අවස්ථාවේ) ඒවා පසුව ක්‍රමවත්ව වෙන් කර ගබඩා කිරීමට හා දහනය කිරීමට ඉන්සි ආයතනයට යොමු කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 හා ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත පරිදි 2017 අංක 1 දරණ ජාතික පාරිසරික නියෝග අනුව ප්ලාස්ටික් අඩංගු කසල එළිමහනේ පිළිස්සීම තහනම් වුවද, මධ්‍යස්ථාන භූමියේ ගොඩගසා තිබූ නොදිරන කසල පිළිස්සීම සිදුකර තිබුණි. | ප්ලාස්ටික් හා පොලිතීන් වැනි නොදිරන කසල පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමකළ යුතු වේ. | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන අවස්ථාවේදී කසළ හලර් කිරීමෙන් පසු ඉතිරි අපද්‍රව්‍ය වළකට දමා ගිනි තබා තිබූ බව එම මධ්‍යස්ථාන භාර නිලධාරියා දන්වා ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 03ක් හඳුනාගෙන තිබූ අතර ව්‍යාපෘතියන් ක්‍රියාත්මක කර තිබුණි. | වාර්ෂික අයවැය පිළියෙල කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හඳුනාගත යුතු අතර ඒවා ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ තිරසර සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේදී සමාජ ආරක්ෂණ ක්‍රමවේද යටතේ දිළිඳු පවුල් වල සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සඳහා බල ප්‍රදේශයෙන් තෝරා ගත් පවුල් 13 ක් සඳහා වැසිකිළි ද්‍රව්‍ය ආධාර සඳහා රු.410280.00 ක් පමණ මුදලක් වැය කර ඇති බව කාරුණිකව දන්වන අතර, දිළිඳුකම පිටු දැකීම සඳහා මෙම වර්ෂයේදී වැඩසටහන් ක්‍රියාත්මක කර නොමැති බවත්, ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත්, කාරුණිකව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වසර 05 කට වැඩි කාලයක් ගත වූ ලැබිය යුතු ගිණුම් ශේෂය රු.1,500,802 ක් විය. | තවදුරටත් අයවිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොකළ ගෙවිය යුතු ශේෂය රු.8,941,889 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ණය හිමියන් සඳහා ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 09 කට අදාලවඅතිරික්ත53 ක් පැවතුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ25/2014 අනුව කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කාර්ය මණ්ඩල 53 ක් අතිරික්තව ඇත්තේ සංවර්ධන නිලධාරී 20 ක් අනුමත කාර්ය මණ්ඩලයට නොමැති බවත්, එම නිලධාරීන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ඇති බවත්, දන්වමි. අනෙකුත් අය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 මගින් ස්ථිර කරන ලද සේවකයන් බවත්, දන්වා සිටිමි. එම සේවකයින් අනුමත කාර්ය මණ්ඩලය වේ. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරද ඇතුලත්ව තනතුරු 12 කට අදාලව පුරප්පාඩු 19 ක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභා ලේකම් තනතුර ඇතුළත්ව තනතුරු 12 කට අදාළ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, කාරුණිකව සඳහන් කරමි. |
| (ඇ) | විශ්‍රාම ගිය, මියගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 07 දෙනෙකුගේ අයවිය යුතු සේවක ණය ශේෂය රු.131,130 ක් විය. | හිඟ සේවක ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතු වේ. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා අදාළ පුද්ගලයන් ලිපි මගින් දැනුවත් කර ඇත. මිය ගිය සේවකයින්ගේ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

**නිශ්කාර්යය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කම්පැක්ටර් රථය හා ට්‍රැක්ටර් ට්‍රේලරයක්නිශ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | කම්පැක්ටර් රථය ත්‍යාගයක් ලෙස ලැබී ඇත. අළුත්වැඩියා කිරීමට බලයක් නොමැති නිසා භාවිතයෙන් තොරව පවතී. ට්‍රැක්ටර් ට්‍රේලරය අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත. |